රිෂාඩ් බදියුදීන්ගේ නිවසේ සේවය කරමින් හිඳ මියගිය බව පැවසෙන බාලවයස්කාර දැරියගේ මරණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීමට පැමිණි එම මියගිය දැරියගේ මවගෙන් විවිධ මාධ්‍ය අදහස් විමසනු අපට නිරීක්ෂණය කළ හැකි විණි. මෙම අදහස් විමසීමේදී එම මව අතේ කුඩා දැරියක්ද සිටි බව දක්නට ලැබිණි.

කෙසේ නමුත්, එම දර්ශනයන් විකාශය කිරීමේදී ටීවී දෙරණ, ස්වර්ණවාහිනී සහ හිරු යන නාලිකාවන්හි පුවත් විකාශයන් තුළ එම දැරියගේ අනන්‍යතාවය හඳුනාගත නොහැකි අයුරින් ඇගේ මුහුණ බොඳ කොට දක්වා තිබිණි. එනමුත් ජාතික රූපවාහිනී සහ ස්වාධීන රූපවාහිනී පුවත් විකාශයන් තුළ එසේ එම දැරියගේ අනන්‍යතාවය සැඟවීමකින් තොරව එම රූප රාමු විකාශය කර තිබිණි.

බාලවයස්කාර දරුවෙකුගේ හෝ දැරියකගේ අනන්‍යතාවය හෙළිදරවු කිරීමේදී ප්‍රවේසම් සහගත විය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළ දැක්වෙයි. ඒ අනුව බලන විට, මෙම දැරිය සිදුවීමට අදාළ නොවූවත්, ඇගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම මගින් ටීවී දෙරණ, ස්වර්ණවාහිනී සහ හිරු යන නාලිකා වඩාත් ආචාර ධාර්මික මාධ්‍ය හැසිරීමක් පෙන්වා ඇතැයි අපට කිව නොහැකිද? අනෙක් අතට ජාතික රූපවාහිනී සහ ස්වාධීන රූපවාහිනී නාලිකාවන් එම ආචාර ධාර්මික මාධ්‍යකරණයෙන් වියුක්ත වී ඇතිවා නොවේද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.unicef.org/.../Children-and-the-media-a...

**#MediaEthicsSL #lka #sinhalanews #TVDerana #Swarnavahini #HiruTV #Rupavahini #ITN**